1.1 විශේෂාංග රූප සටහන

## සේවා සහ සේවා-නොවන උද්ධමනයේ හැසිරීම

### සේවා, සේවා-නොවන, සහ මතුපිට උද්ධමනයේ හැසිරීම (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය)




### මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය)




සටහන: 2023 වසරේ ජනවාරි මාසයට පෙර දත්ත කො.පා.මි.ද. (2013=100) මත සහ 2023 වසරේ ජනවාරි මාසයේ සිට දත්ත කො.පා.මි.ද. (2021=100) මත පදනම් වේ.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්, ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සේවා උද්ධමනය යනු නිවාස කුලී, ආපන ශාලා සහ හෝටල් සේවා, අධ්‍යාපනය, සන්නිවේදනය සහ ප්‍රවාහන ආදී සේවා මිල ගණන් කාලයත් සමග ඉහළ යෑමයි. භාණ්ඩ මිල ගණන්වලට සාපේක්ෂව, සේවා මිල ගණන් අඩු උච්චාවචන සහිතව සැපයුම් අංශයේ අවහිරතා හෝ බාහිර කම්පන සඳහා ක්‍රමානුකූලව සහ වඩාත් මන්දගාමීව වෙනස්වීමේ ප්‍රවණතාවක් පවතී. තවද, සේවා මිල ගණන්, වැටුප් ආශ්‍රිත වෙනස්වීම් ඇතුළු දේශීය සාධක මත සැලකිය යුතු ලෙස රඳා පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස, සේවා උද්ධමනය යටිදැරි උද්ධමන පීඩන පිළිබිඹු කරන වඩාත් වැදගත් දර්ශකයක් ලෙස ක්‍රියා කරයි.

ශ්‍රී ලංකාවේ සේවා උද්ධමනය හඳුනා ගැනීම සඳහා පාරිභෝගික මිල දර්ශකයේ පැසෙහි ඇතුළත් අනු-කාණ්ඩ භාවිත කළ හැකිය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද වර්ගීකරණයකට අනුව, සේවා සම්බන්ධ සංරචක කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද.) පාරිභෝගික පැසෙහි අඩකට ආසන්න ප්‍රමාණයක් නියෝජනය කරයි.[1] එබැවින් සේවා මිල ගණන්හි විචලනයන් මතුපිට උද්ධමනය සහ සමස්ත ජීවන වියදම මත සැලකිය යුතු මට්ටමේ බලපෑමක් ඇති කරයි. ඒ හේතුවෙන් සේවා උද්ධමනය නිරීක්ෂණය කිරීම, ඒ සඳහා බලපාන සාධක හඳුනා ගැනීමට සහ උද්ධමන වාතාවරණය අධ්‍යයනය කිරීම සඳහා වැදගත් වේ.

රූප සටහන මගින් 2015 සිට 2026 මුල් කාලය දක්වා කාලසීමාව තුළ සේවා, සේවා-නොවන සහ මතුපිට උද්ධමනයේ වාර්ෂික ලක්ෂ්‍යමය හැසිරීම පෙන්නුම් කරයි. සේවා-නොවන උද්ධමනයෙහි දක්නට ලැබුණු සැලකිය යුතු උච්චාවචන සමග සසඳන විට, සේවා උද්ධමනය කාල සීමාව පුරා සාපේක්ෂව ස්ථායීව පැවතී ඇත. මතුපිට අවධමන තත්ත්වයක් පැවති සහ සේවා-නොවන කාණ්ඩයේ අවධමනය වැඩි වශයෙන් තීව්‍ර වූ කාලයේ දී පවා සේවා උද්ධමනය ධන අගයන්හි පැවතෙමින් සමස්ත උද්ධමනය ඉහළ යාම සඳහා පීඩන ඇති කිරීම අඛණ්ඩව සිදු වී ඇති බව මෙමගින් ගම්‍ය වන සැලකිය යුතු කරුණකි.

---

1 ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩලය විසින්, 2018 වසරේ අරමුණ අනුව ඒකපුද්ගල පරිභෝජන වර්ගීකරණය (Classification of Individual Consumption According to Purpose (COICOP) 2018) භාවිත කරමින්, සමස්ත (මතුපිට) පාරිභෝගික මිල දර්ශකයේ භාණ්ඩ සහ සේවා පැසෙහි (2013=100 සහ 2021=100) අඩංගු අනු-කාණ්ඩ අතරින් සේවා සම්බන්ධ සංරචක උකහා ගෙන ඇත. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, 2025 අගෝස්තු මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ පළවූ 'විශේෂ සටහන (ආ): සේවා උද්ධමනය පිළිබඳ දැනුම්වත් වීම: එය වැදගත් වන්නේ ඇයි?' යන විශේෂ සටහන බලන්න.